## 19. 1996 අංක 01 දරන දකුණු පළාත් ග්‍රාම සංවර්ධන කෙටුම්පත් ප්‍රඥප්තිය.

දකුණු පළාත තුළ ග්‍රාම සංවර්ධන සමිති පිහිටුවීම, ලියාපදිංචි කිරීම හා පවත්වාගෙන යෑම, ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බලමණ්ඩල පිහිටුවීම, ලියාපදිංචි කිරීම හා පවත්වාගෙන යෑම, ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් බලමණ්ඩල පිහිටුවීම, ලියාපදිංචි කිරීම හා පවත්වාගෙන යෑම, කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන පිහිටුවීම හා පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය විධිවිධාන සැලැස්වීම ද, ඊට සම්බන්ධ හෝ අනුශංගික හෝ කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම ද සඳහා වූ ප්‍රඥප්තියයි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, දකුණු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

### 1 වෙනි කොටස

ලුහුඬු නාමය

**01.** මෙම ප්‍රඥප්තිය "ශ්‍රී ලංකාවේ දකුණු පළාත් සභාවේ අංක........... දරන ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දින සිට ක්‍රියාත්මක වේ.

පරමාර්ථය හා කාර්යයන්

**02.** දකුණු පළාත් සභා බලප්‍රදේශයේ ජනතාවගේ සහභාගිත්වයෙන්, ඔවුන් දැනුවත් කරමින්, ඔවුන්ගේ කුසලතාවයන් හා ස්වශක්තිය වර්ධනය කරමින්, ඔවුන්ගේම සැලසුම් සහගත ක්‍රියාකාරකම් පාදක කර ගත් ආර්ථික, සමාජයීය හා අධ්‍යාත්මික සංවර්ධනයක් ඇති කිරීම සඳහා මතු දැක්වෙන විධිවිධානවලට අනුකූලව:

- i. ග්‍රාම සංවර්ධන සමිති සංවිධානය කිරීම, පිහිටුවීම, ලියාපදිංචි කිරීම හා පවත්වාගෙන යෑම.
- ii. ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බලමණ්ඩල සංවිධානය කිරීම, පිහිටුවීම, ලියාපදිංචි කිරීම හා පවත්වාගෙන යෑම.
- iii. ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් බලමණ්ඩල සංවිධානය කිරීම, පිහිටුවීම, ලියාපදිංචි කිරීම හා පවත්වාගෙන යෑම.
- iv. කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන පිහිටුවීම හා පවත්වාගෙන යෑම.
- v. ග්‍රාමීය නායකත්වය හා ප්‍රජාසේවා ව්‍යාපෘති සඳහා පුහුණු වැඩ සටහන් සංවිධානය හා පවත්වාගෙන යෑම.

ග්‍රාම සංවර්ධන සමිති හා බලමණ්ඩල ව්‍යවස්ථා

**03.** මෙම ප්‍රඥප්තිය අනුව පිහිටුවනු ලබන ග්‍රාම සංවර්ධන සමිතිවලටද, ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බලමණ්ඩලවලටද, ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් බලමණ්ඩලවලටද පිළිවෙලින් වෙන වෙනම ව්‍යවස්ථා තුනක් තිබිය යුතුය. එම ව්‍යවස්ථා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අනුමත කරන ලද ආදර්ශ ව්‍යවස්ථා අනුව සකස් කරන ලද ව්‍යවස්ථා විය යුතුය



ග්‍රාම සංවර්ධන සමිතියක බලප්‍රදේශය

**04.** i. ග්‍රාම සංවර්ධන සමිතියක බලප්‍රදේශය, ග්‍රාම නිලධාරී වසමකට වඩා විශාල නොවිය යුතුය. එකම ග්‍රාම නිලධාරී වසමක් තුළ ආර්ථික, සමාජයීය හා භූගෝලීය වශයෙන් අනන්‍යතාවයක් ඇති ගම් ගොඩක්, යායක් හෝ වතු ඒකකයක් සඳහා වෙන වෙනම සමිති පිහිටුවිය හැකිය.

ii. ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බලමණ්ඩලයක, බලප්‍රදේශය වන්නේ ප්‍රාදේශීය ලේකම්වරයෙකුගේ බලප්‍රදේශයයි. එසේ වුවත් ජනගහණය හා භූ විෂමතාවය වැනි සුවිශේෂ හේතුවක් ඇත්නම්, ග්‍රාමසංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ඇතිව, එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් සඳහා, ප්‍රාදේශීය බල මණ්ඩල දෙකක් පිහිටුවා ඒ සඳහා බලප්‍රදේශ දෙකක් බෙදා වෙන් කළ හැකිය.

iii. ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් බලමණ්ඩලයක බල ප්‍රදේශය වන්නේ දිසා ලේකම්වරයෙකුගේ බල ප්‍රදේශය වන දිස්ත්‍රික්කය වේ.

ග්‍රාම සංවර්ධන සමිතියක කාර්යභාරය

ග්‍රාම සංවර්ධන සමිතියක කාර්යභාරය වන්නේ සමිතියේ පරමාර්ථය ඉටුකර ගැනීම සඳහා පහත සඳහන් උපාය මාර්ග උපයෝගී කරගෙන කටයුතු කිරීමය.

- (අ) ගමේ ඇති භෞතික හා මානව සම්පත් මැනවින් අධ්‍යයනය කිරීම.
- (ආ) නිෂ්පාදනයේදී ද, අලෙවියේදී ද පාරිභෝගික අවශ්‍යතා සපුරා ගැනීමේදී ද, මතුවන ගැටළුවලට මුහුණදීමට අවශ්‍ය සංවිධාන ශක්තිය ගොඩනැගීම.
- (ඇ) දැනට ගමේ ඇති ආදායම් මාර්ග වර්ධනය කරගැනීම හා නව ආදායම් මාර්ග මතුකර ගැනීම.
- (ඈ) වත්මන් ආර්ථික අභියෝගවලට මුහුණ දීමට අවශ්‍ය ව්‍යාසායකත්ව දැනුම හා නව තාක්ෂණ දැනුම වර්ධනය කිරීම.
- (ඉ) බාහිර සම්පත් හා සේවාවන් හඳුනාගෙන ඒවා ගමේ අවශ්‍යතාවලට උචිත ලෙස ගමට ගලපා ගැනීමට ක්‍රියා කිරීම.
- (ඊ) සැලසුම්කරණය හා ක්‍රම සම්පාදනය මගින් සමිතියේ ප්‍රතිලාභ ලබන අයගේ ජීවන තත්ත්වය උසස් කිරීමට කටයුතු කිරීම.
- (උ) ප්‍රාග්ධන ශක්තිය වර්ධනය කර ගැනීමට අවශ්‍ය අරමුදල් ගොඩනැගීම.



ප්‍රාදේශීය බලමණ්ඩලයක කාර්යභාරය

**06.** ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බලමණ්ඩලයක කාර්යභාරය වන්නේ, ග්‍රාම සංවර්ධන සමිතිවලට වර්ධනය සඳහා, පහත සඳහන් කටයුතු කිරීමය:-

- I. ග්‍රාම සංවර්ධන සමිති පවත්වාගෙන යෑම සඳහා, උපදෙස් දීම හා පුහුණු කටයුතු සකස් කිරීම
- II. ග්‍රාම සංවර්ධන සමිතිවල ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අරමුදල් ගොඩනැගීම.
- III. ප්‍රාදේශීය හා දිස්ත්‍රික් සැලසුම් සම්පාදන කාර්යයේදී, සමිති නියෝජනය කිරීම හා යෝජනා ඉදිරිපත් කිරීම.
- IV. ග්‍රාම සංවර්ධන සමිතිවල පැවැත්ම සඳහා, අන්‍යෝන්‍යාධාර ක්‍රම හා ණය ආධාර ක්‍රම ඇති කිරීම.
- V. ග්‍රාම සංවර්ධන සමිතිවල පරමාර්ථය ඉටුකර ගැනීම සඳහා, අදාළ වන්නා වූ හා අවශ්‍ය වන්නාවූ වෙනත් කටයුතු කිරීම.
- VI. සමිති අතර සම්බන්ධීකරණය ඇති කිරීම.

ග්‍රාමසංවර්ධන දිස්ත්‍රික් බලමණ්ඩලයක කාර්යභාරය

**07.** ග්‍රාමසංවර්ධන දිස්ත්‍රික් බල මණ්ඩලයක කාර්යභාරය වන්නේ, සිය බලප්‍රදේශය තුළ ඇති ග්‍රාම සංවර්ධන සමිති හා ග්‍රාමසංවර්ධන ප්‍රාදේශීය බලමණ්ඩලවල අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය, සම්බන්ධීකරණය හා මාර්ගෝපදේශකත්වය දීම සඳහා, පහත සඳහන් කටයුතු කිරීමය:-

- I. සංවර්ධනය සඳහා කටයුතු කරන, රජයේ දෙපාර්තමේන්තු හා රජයේ නොවන ස්වේච්ඡා සංවිධාන සමග ග්‍රාම සංවර්ධන සමිති හා ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බලමණ්ඩලවල සම්බන්ධතාවයක් ඇති කිරීමට කටයුතු කිරීම.
- II. සංවර්ධන සැලසුම්කරණයේදී, ග්‍රාම සංවර්ධන සමිතිවල අත්දැකීම්, අදහස් හා යෝජනා, උපයෝගී කරගත හැකි ක්‍රම, උපායයන් සකස් කිරීම.
- III. ප්‍රජා සංවර්ධන ප්‍රවේශය වෙනුවට, ඉලක්ක කණ්ඩායම් සමග දුප්පත්කම අවම කිරීම සඳහා වූ සහභාගිත්ව ප්‍රවේශය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පර්යේෂණ කටයුතු ද, සමීක්ෂණ කටයුතු ද, පුහුණු කිරීමේ කටයුතු ද සැලසුම් කිරීම හා මෙහෙයවීම.



- IV. ග්‍රාම සංවර්ධන පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ හා අදාළ වන්නාවූ වෙනත් කටයුතු කිරීම.
- V. ග්‍රාම සංවර්ධන කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථානවල කටයුතු සංවිධානය හා පවත්වාගෙන යාම.

### 2 වන කොටස

නිලධාරීන් අනුයුක්ත කිරීම

**08.** දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ, නවවන උපලේඛනයේ, 1 වන ලැයිස්තුවේ (පළාත්සභා - ලැයිස්තුවේ අංක 10 යටතේ විමධ්‍යගත කරන ලද) ග්‍රාම සංවර්ධන විෂය සඳහා, ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පත්කරනු ලැබ දකුණු පළාතේ, ගාල්ල, මාතර, හම්බන්තොට යන දිස්ත්‍රික්කවල සේවයේ යොදවා සිටි ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් නිලධාරීන්, ග්‍රාම සංවර්ධන නිලධාරීන් හා මැහුම් ප්‍රදර්ශිකාවන් හා මැහුම් පරිපාලිකාවන්ද, ග්‍රාම සංවර්ධන පුහුණු මධ්‍යස්ථානවල කණිෂ්ඨ සේවකයන්ද, මෙම ප්‍රඥප්තිය යටතේ දකුණු පළාත් සභාවේ, ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයට අනුයුක්ත කරනු ලැබේ.

ග්‍රාම සංවර්ධන පළාත් අධ්‍යක්ෂ පත්කිරීම

**09.** (i) දකුණු පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයට ග්‍රාම සංවර්ධන පළාත් අධ්‍යක්ෂවරයෙකු පත්කරනු ලැබිය යුතුය.

ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයා විසින් ඔහු වෙත මෙම ප්‍රඥප්තිය යටතේ අමාත්‍යවරයා විසින් පවරනු ලබන කාර්යයන් සහ රාජකාරි යථා පරිදි ඉටු කිරීම සම්බන්ධයෙන් වගකිව යුතුය.

(ii) පළාත් අධ්‍යක්ෂවරයාගේ බලතල හා කාර්යභාරය අමාත්‍යවරයා විසින් නිශ්චය කළ යුතු අතර, මෙම ප්‍රඥප්තියේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා ඔහු අමාත්‍යාංශ ලේකම්වරයාගේ අධීක්ෂණය යටතේ ක්‍රියා කළ යුතුය.

ග්‍රාම සංවර්ධන සහකාර අධ්‍යක්ෂවරුන් පත් කිරීම

**10.** (i) ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ පළාත් අධ්‍යක්ෂවරයාට සහායවීම පිණිස ගාල්ල, මාතර, හම්බන්තොට දිස්ත්‍රික්ක සඳහා සහකාර අධ්‍යක්ෂවරුන් තුන් දෙනෙකුද, පුහුණු හා පර්යේෂණ කටයුතු සඳහා සහකාර අධ්‍යක්ෂවරයෙකු ද පත්කළ යුතුය.

(ii) මෙම ප්‍රඥප්තිය යටතේ අමාත්‍යවරයා විසින් පවරනු ලබන කාර්යයන් හා රාජකාරි යථා පරිදි ඉටුකිරීම සම්බන්ධයෙන් ඔවුන් වගකිව යුතුය.

**11.** මෙම ප්‍රඥප්තිය යටතේ, අපේක්ෂිත කාර්යයන් ඉටු කිරීම සඳහා කලින් කල අවශ්‍ය විය හැකි වෙනත් නිලධාරීන් ද පත්කරනු ලැබිය හැකිය.

**12.** මෙම ප්‍රඥප්තියේ 9, 10, 11 යන වගන්ති යටතේ පත් කරනු ලබන සියළුම නිලධාරීන්, දණ්ඩ නීති සංග්‍රහයේ, අර්ථානුකූලව රජයේ නිලධාරීන් ලෙස සලකනු ලැබිය හැකිය.

**13.** මෙම ප්‍රඥප්තිය යටතේ ක්‍රියා කරන යම් රාජ්‍ය නිලධාරියෙකු විසින් සත්භාවයෙන් කරන ලද හෝ නොකරන ලද හෝ යම් කාර්යයන් සම්බන්ධයෙන්, ඔහුට විරුද්ධව කිසිදු නඩුවක් නොවිය යුතුය.

**14.** මෙම ප්‍රඥප්තියේ 9, 10, 11 යන වගන්ති යටතේ පත් කරන ලද සියළුම නිලධාරීන්, තම බලතල ක්‍රියාත්මක කිරීමේදී, අමාත්‍යවරයා විසින් හෝ අමාත්‍යාංශ ලේකම්වරයා විසින් හෝ නිකුත් කරනු ලබන පොදුවූද, විශේෂ වූද නියෝගවලට හා විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතුය.

## 3 වෙනි කොටස

දකුණු පළාත් ග්‍රාම සංවර්ධන පොදු අරමුදල් ගිණුම

**15.** (i) දකුණු පළාත් ග්‍රාමසංවර්ධන කටයුතු කිරීමේදී, අවශ්‍ය අවස්ථාවන්හිදී, මෙහි සඳහන් පරමාර්ථයන් මුදුන්පත් කර ගැනීම අරමුණු කර ගනිමින්, කළයුතු ආධාර හා වියදම් සඳහා මෙහි මින්මතු "අරමුදල් ගිණුම" යනුවෙන් සඳහන් කරන්නා වූ හා "දකුණු පළාත් ග්‍රාම සංවර්ධන අරමුදල් ගිණුම" යනුවෙන් හැඳින්වෙන්නා වූ ගිණුමක්, පළාත් සභා අරමුදලේම ගිණුමක් වශයෙන් පවත්වාගෙන යා හැකිය.

(ii) මෙම අරමුදල් ගිණුම, 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 111 වැනි කොටසේ විධිවිධානවලට අනුකූල විය යුතුය.

(iii) මෙම අරමුදල් ගිණුමට, පහත සඳහන් මුදල් බැරකළ යුතුය:-

(අ) රජය මගින් ආධාර වශයෙන් වරින්වර ප්‍රදානය කරනු ලැබිය හැකි මුදල්.

(ආ) දකුණු පළාත් සභාව විසින්, අරමුදල් ගිණුමේ කාර්යයන් සඳහා සම්මත කරනු ලැබිය හැකි මුදල්.

(ඇ) යම් පුද්ගලයෙක්, ආයතනයක් හෝ සංවිධානයක් මගින් කෙරෙන පරිත්‍යාග වශයෙන් ලැබෙන සියලුම මුදල්.

(ඈ) පළාත් සභා පනතේ 22 වගන්තිය යටතේ රජය විසින් ලබාදෙන විදේශීය ආධාර වශයෙන් ලැබෙන සියලුම මුදල්.

අවශ්‍ය වෙනත් නිලධාරීන් පත්කිරීම



(ඉ) සංදර්ශන, ලොතරැයි හා වෙනත් සම්මත ක්‍රමවලින් ලබාගන්නා සියලුම මුදල්

(iv) එසේ වුවද, යම් නිශ්චිත කාර්යයන් සඳහා යෙදවිය යුතුය යන කොන්දේසිය පිට II , III වගන්තියේ, ඇ, ඈ, ඉ යටතේ මුදලක් ලැබුණු අවස්ථාවක, එම මුදල අරමුදලේ ගිණුමේ බැරට බාර ගැනීම ඇමතිවරයාගේ අභිමතය පරිදි විය යුතුය.

අරමුදල් ගිණුමෙහි පාලනය,

**16.** (i) අමාත්‍යවරයාගේ අභිමතය පරිදි, පත් කරනු ලබන මණ්ඩලයක උපදේශකත්වය යටතේ අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව අරමුදල් ගිණුම පවත්වාගෙන යැමේ වගකීම අමාත්‍යාංශ ලේකම්වරයා සතුය.

(ii) එක් එක් ලිත් වර්ෂය සඳහා, සම්පූර්ණ ලෙස හා උචිත ලෙස ගිණුම් පවත්වා ගෙන යැමට ලේකම්වරයා විසින් විධිවිධාන සැලැස්විය යුතුය.

(iii) එක් එක් ලිත් වර්ෂය අවසන් වූ පසු, හැකිතාක් ඉක්මනින් අරමුදල් ගිණුමේ පරිපාලනය පිළිබඳ වාර්තාවක් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් සකස් කළ යුතුය.

(iv) 1971 අංක 38 දරන මුදල් පනතේ, 11 කොටසේ විධිවිධාන අනුව අවශ්‍ය වෙනස්කම් සහිතව, අරමුදල් ගිණුමේ මුදල් පාලනය සහ ගණන් හිලව් සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

(v) අරමුදල් ගිණුමේ මුදල් වර්ෂය, ලිත් වර්ෂය විය යුතුය.

අරමුදල් ගිණුම පිළිබඳ වාර්තාව

**17.** අමාත්‍යවරයා විසින් හැකිතාක් ඉක්මනින්, එක් එක් ලිත් වර්ෂය සඳහා වූ අරමුදල් ගිණුමේ පරිපාලනය ගැන වූ වාර්තාවක්ද, එම අරමුදල් ගිණුමේ විගණනය කරන ලද, එම වර්ෂයේ ගිණුම්වල පිටපතක් ද, එම ගණන් පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව සමඟ දකුණු පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලය හා දකුණු පළාත් සභාව හමුවේ තැබිය යුතුය.

අරමුදල් ගිණුමින් කරනු ලබන ගෙවීම්

**18.** මෙම ප්‍රඥප්තියේ සඳහන් පරමාර්ථය ඉටුකර ගැනීම සඳහා කරනු ලබන වැඩ සටහන් වෙනුවෙන් අදාළ උපදේශක මණ්ඩලයේ නිර්දේශය මත අමාත්‍යවරයාගේ අනුමැතියෙන් ගෙවීම් කටයුතු කළ හැකිය.



## 4 වෙනි කොටස

**19.** අමාත්‍යවරයා විසින්, පහත සඳහන් කාර්යයන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානයක් හෝ ප්‍රදානයන් පිහිටුවනු ලැබිය හැකිය.

ශිෂ්‍යත්ව ප්‍රදානයක් පිහිටුවීම

(අ) සංවර්ධන ක්ෂේත්‍රයේ නව ප්‍රවේශයක් ක්‍රියාත්මක කිරීමේදී, මතුවන ගැටලු හා පරිපාලන ක්ෂේත්‍රයේදී ඇතිවන අනුබද්ධ ගැටළු විසඳීමේ විධි ක්‍රම පිළිබඳ දැනුමක් ලබාදීම.

(ආ) කාන්තා අභිවෘද්ධි කටයුතු පිළිබඳ, ක්ෂේත්‍රයේ නියුතු පරිපාලිකාවන්ට හා ප්‍රදර්ශිකාවන්ට ඔවුන්ගේ කටයුතුවලට අදාළ නව තාක්ෂණ දැනුම ලබාදීම.

(ඇ) ග්‍රාමීය, ප්‍රාදේශීය හා දිස්ත්‍රික්ක මට්ටමේදී, නිර්මාණශීලී දක්ෂතාවන් දක්වන සමිතිවල හා බලමණ්ඩලවල සාමාජිකයන්ට වැඩිපුර දැනුමක් ලබාදීම.

**20.** ඉහත සඳහන් ශිෂ්‍යත්ව සඳහා දේශීය හා විදේශීය අරමුදල් උපයෝගී කරගත හැකිය.

**21.** මෙම ශිෂ්‍යත්ව සඳහා අරමුදල් යෙදවීම හා ශිෂ්‍යත්වලාභීන් තෝරා ගැනීම, අමාත්‍යවරයාගේ අවසාන තීරණයන්ට යටතේ වේ.

## 5 වෙනි කොටස

අනුමත ව්‍යවස්ථාවලට පටහැනිව කටයුතු කිරීම

**22.** ග්‍රාමසංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අනුමත කරන ලද ව්‍යවස්ථාව අනුව, කටයුතු කිරීමට සියළු ග්‍රාම සංවර්ධන සමිතිවලද, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් බලමණ්ඩලවල ද නිලධාරීන් බැඳී සිටී.

**23.** ලියාපදිංචි කරන ලද සියළුම ග්‍රාම සංවර්ධන සමිතිවල ලේඛනයක්ද, සියලුම ප්‍රාදේශීය බලමණ්ඩලවල හා දිස්ත්‍රික් බලමණ්ඩලවල ලේඛනයක්ද ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යා යුතුය.

**24.** සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ලියාපදිංචි කරන ලද, ග්‍රාමසංවර්ධන සමිති ලේඛනයක් ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පවත්වාගෙන යා යුතුය.

**25.** (i) මෙම ප්‍රඥප්තියේ ඇති පරමාර්ථයන්ට හා අනුමත ව්‍යවස්ථාවට පටහැනිව ක්‍රියා කරන බවට චෝදනා ලැබ ඇති අමාත්‍යාංශයේලේකම්වරයාගේ නියමයෙන් පවත්වන ලද විධිමත් පරීක්ෂණයකින් වැරදිකරුවන් වන සමිතියේ හෝ බලමණ්ඩලයේ නිලධාරී මණ්ඩලය විසුරුවා හැරීමට අමාත්‍යාංශ ලේකම්වරයාට බලය තිබේ.



(ii) ඉහත සඳහන් ලෙස නිලධාරී මණ්ඩලය විසුරුවා හරින ලද සමිතිය හෝ බලමණ්ඩලය ලියාපදිංචිය අවලංගු කිරීමට හෝ නැවත ප්‍රතිසංවිධානය කිරීමට අවශ්‍ය කටයුතු කිරීමට අමාත්‍යාංශ ලේකම්වරයාට බලය තිබේ.

(iii) ලියාපදිංචිය අවලංගු කරන ලද සමිතියකට හෝ බලමණ්ඩලයකට අයත් සියලුම දේපල ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය වෙත පැවරේ. අමාත්‍යාංශ ලේකම්වරයා විසින් නම් කරනු ලබන නිලධාරියෙකුට එම දේපල භාරදී නිදහස් වනතුරු විසුරුවා හරින ලද නිලධාරී මණ්ඩලය වගකීමෙන් නිදහස් නොවේ.

අර්ථ නිරූපණය.

**26.** (i) "අමාත්‍යවරයා" යන්නෙන් අදහස් වන්නේ දකුණු පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන විෂය භාර අමාත්‍යවරයාය .

(ii) "අමාත්‍යාංශ ලේකම්වරයා" යන්නෙන් අදහස් වන්නේ දකුණු පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාය.

(iii) "දේපල" යන්නෙන් අදහස් වන්නේ ග්‍රාම සංවර්ධන සමිතිය හෝ ග්‍රාම සංවර්ධන බලමණ්ඩලය සතු පොත්පත්, ලේඛන අත ඉතිරි හා බැංකුගත මුදල්, ලීබඩු, උපකරණ, ගොඩනැගිලි හා ඉඩකඩම් යන සියලුම දේපලය.

**27.** මෙම ප්‍රඥප්තියේ සිංහල පාඨය, දෙමළ පාඨය හා ඉංග්‍රීසි පාඨය අතර යම් නොපැහැදිලිකමක් ඇතිවූ අවස්ථාවක සිංහල පාඨය බලපවත්වන්නේය.

**05-48**